*සැ. යු.-* මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2024 වර්ෂය සඳහා ගාල්ල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,379 - 2024 අප්‍රේල් මස 05 වැනි සිකුරාදා - 2024.04.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබල ාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 අප්‍රේල් මස 26 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 අප්‍රේල් මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාල යට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

**දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය**

දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවරයා විසින් සිදු කරනු ලබන පත්කිරීම්

දකුණු පළාත් සභාවේ පහත නම් සඳහන් නිලධාරීන් පහත සඳහන් කර ඇති දින වකවානුවල දී ම විසින් දකුණු පළාත් සභාවේ පහත තනතුරු සඳහා පත්කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

| *අනු. අංකය* | *නිලධාරියාගේ නම* | *පත් කරන ලද තනතුර හා සේවා ස්ථානය* | *පත් කරන ලද දිනය* |
|---|---|---|---|
| 01 | සී. බී. අභයධීර මහත්මිය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, (පළමු ශ්‍රේණිය) | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) - *වැඩ බලන,* නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) - කාර්යාලය, කොටුව, ගාල්ල | 2024.01.16 |
| 02 | එන්. එම්. ආනන්ද අමරදේව මහතා, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය, (විශේෂ ශ්‍රේණිය) | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරන) - ප්‍රධාන ලේකම් කාර්යාලය, දකුණු පළාත | 2024.01.31 |
| 03 | දිලේඛා කුඩාච්චි මහත්මිය, ශ්‍රී ලංකා පරිපාලන සේවය, (පළමු ශ්‍රේණිය) | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) - *වැඩබලන,* ප්‍රධාන ලේකම් කාර්යාලය, දකුණු පළාත | 2024.02.01 |
| 04 | කේ. යූ. චන්ද්‍රලාල් මහතා, ශ්‍රී ලංකා පරිපාලන සේවය, (විශේෂ ශ්‍රේණිය) | ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, දකුණු පළාත. | 2024.03.16 |
| 05 | රනිල් වික්‍රමසේකර මහතා, ශ්‍රී ලංකා පරිපාලන සේවය, (පළමු ශ්‍රේණිය) | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) - *වැඩබලන,* ප්‍රධාන ලේකම් කාර්යාලය, දකුණු පළාත | 2024.03.16 |

ආචාර්ය ඩබ්ලිව්. ඩබ්ලිව්. ගමගේ,
ආණ්ඩුකාරවර,
දකුණු පළාත.

2024 මාර්තු මස 26 වැනි දින,
ගාල්ල,
පහළ ඩික්සන් පාරේ,
දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ දී ය.

04-46

# පළාත් සභා නිවේදන

**සබරගමුව පළාතේ පළාත් සභාව**

සබරගමුව පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමන්ගේ නිවේදන

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වගන්තිය සමඟ කියවිය යුතු (267 වන අධිකාරිය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බලංගොඩ නගර සභාවේ ලේකම් හා බලතල කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි වශයෙන් ප්‍රතිපත්ති හා තීරණ ගැනීමට සහාය වීමේ කමිටු නිර්දේශ මත තීරණ කරන ලද

පහත සඳහන් තීරණය, එකී වගන්තියේ (2) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාතේ ආණ්ඩුකාරවර නවීන් දිසානායක වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

නවීන් දිසානායක,
ආණ්ඩුකාරවර,
සබරගමුව පළාත් සභාව.

2024 පෙබරවාරි මස 20 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දී ය.

**තීරණය**

බලංගොඩ නගර සභාවේ ලේකම් හා බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරීගේ තීරණ පොතේ 2023.09.27 දිනැති 2023/09/27/02 අංක දරන තීරණය.

බලංගොඩ නගර සභාවේ ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි වශයෙන් 2023/09/27 දිනැති ප්‍රතිපත්ති හා තීරණ ගැනීමට සහය වීමේ කමිටු නිර්දේශ මත තීරණ අංක 2023 අංක 09, අංක 27, අංක 02 යටතේ බලංගොඩ නගර සභා සීමාව තුළ පවත්වනු ලබන ''එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුළු වීම පිණිස කරනු ලබන ගෙවීමකින් 10% (සියයට දහයකට) සමාන බද්දක් අයකළ යුතු යැයි මම තීරණය කරමි.''

04-25

---

**සබරගමුව පළාතේ පළාත් සභාව**

සබරගමුව පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමාගේ නිවේදන

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වගන්තිය සමඟ කියවිය යුතු (267 වන අධිකාරිය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර ඇඹිලිපිටිය නගර සභාව විසින් සම්මත කරන ලද පහත සඳහන් යෝජනාව, එකී වගන්තියේ (2) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාතේ ආණ්ඩුකාරවර නවීන් දිසානායක වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

නවීන් දිසානායක,
ආණ්ඩුකාරවර,
සබරගමුව පළාත් සභාව.

2024 මාර්තු මස 05 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දී ය.

**යෝජනාව**

2023.01.09 දිනැති මහ සභාවේ අංක 4.2 යටතේ ගරු සභාපති එස්. පී. දිනේෂ් මධුෂංක ඉදිරිපත් කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ජේ. නිහාල් විජේසිංහ විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව තීරණ අංක 18 යටතේ ඒකමතිකව සභා සම්මත විය.

''1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනත වූ (267 වන අධිකාරිය) ප්‍රකාරව විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ 1 වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව ඇඹිලිපිටිය නගර සභාවේ පරිපාලන සීමාව ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන, එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුළු වීම පිණිස කරනු ලබන ගෙවීමකින් 10% (සියයට දහයක) සමාන බද්දක් පනවා අයකළ යුතු යයි ද, මෙම යෝජනා සම්මතය *ගැසට් පත්‍රයේ* පළකරන ලද මාසයට ඉක්බිතිව එළඹෙන මාසයේ පළමු වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු යයි ද යෝජනා කරන්නීය.''

04-26

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2024 වර්ෂය** | | | |
| අප්‍රේල් | 2024.04.05 | සිකුරාදා | 2024.03.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.04.10 | බදාදා | 2024.03.28 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2024.04.19 | සිකුරාදා | 2024.04.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.04.26 | සිකුරාදා | 2024.04.10 | බදාදා | දහවල් | 12.00 |
| මැයි | 2024.05.03 | සිකුරාදා | 2024.04.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.05.10 | සිකුරාදා | 2024.04.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.05.17 | සිකුරාදා | 2024.05.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.05.22 | බදාදා | 2024.05.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.05.31 | සිකුරාදා | 2024.05.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජුනි | 2024.06.07 | සිකුරාදා | 2024.05.22 | බදාදා | දහවල් | 12.00 |
| | 2024.06.14 | සිකුරාදා | 2024.05.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.06.20 | බ්‍රහස්පතින්දා | 2024.06.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.06.28 | සිකුරාදා | 2024.06.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.